# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2141/28 - 2019 සැප්තැම්බර් මස 18 වැනි බදාදා - 2019.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජනාධිපතිවරණය - 2019

### තමාගේ ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන එම ඡන්ද මධ්‍යස්ථානයට ගොස් ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති අයට වෙනත් ඡන්ද මධ්‍යස්ථානයකදී ඡන්දය දීම සඳහා වූ පහසුකම

**1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීමේ පනතේ 119 ආ වැනි වගන්තිය**

තමාගේ ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන, එම ඡන්ද මධ්‍යස්ථානයට ගොස් තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන්ට වෙනත් ඡන්ද මධ්‍යස්ථානයකදී ඡන්දය දීම සඳහා පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලුම් කළ හැකි ය. 1988 අංක 16 දරන පනතින් සංශෝධනය කරන ලද 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 119 ආ වගන්තිය යටතේ ඒ සම්බන්ධ ප්‍රතිපාදන සලසා ඇත.

02. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත්‍ර සියලුම දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී කාර්යාලවලින් ලබා ගත හැකි ය. නීත්‍යානුකූලව නාමයෝජනා දැන්වීමේ දින සිට දින 7 ක් ඇතුළත දී, එනම් 2019 සැප්තැම්බර් මස 25 දින හෝ ඊට පෙර අදාළ ඉල්ලුම්පත්‍ර මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය යන ලිපිනයට එවිය යුතු ය.

03. ඉල්ලුම්කරු පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී ලවා ඉල්ලුම් පත්‍ර සහතික කරවා ගත යුතු අතර ජාතික හැඳුනුම්පතේ අංකය ඉල්ලුම්කරු විසින් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කිරීම අවශ්‍ය වේ. ග්‍රාම නිලධාරී සහතිකය නොමැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ඉල්ලුම්කරුවන් විසින් 2018 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය පදනම් කරගෙන ඡන්ද හිමි නාමලේඛනයේ ඇතුළත් තොරතුරු ඉල්ලුම්පත්වල සැපයිය යුතු අතර එම නාමලේඛන සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල/කච්චේරිවල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල තබනු ඇත.

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය | එන්. ජේ. අබේසේකර | එස්. රත්නජීවන් එච්. හූල් |
| සභාපති | සාමාජික | සාමාජික |
| මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව |

2019 සැප්තැම්බර් මස 18 වැනි දින,
රාජගිරිය, මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.


1A - G 30917 — 267 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*